# හින්දී භාෂාව

# हिंदी

## විෂය නිර්දේශය

## 12 සහ 13 ශ්‍රේණි

(2017 සිට ක්‍රියාත්මක වේ.)

සම්භාව්‍ය හා විදේශ භාෂා අංශය
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk

හින්දි භාෂාව

විෂය නිර්දේශය

12, 13 ශ්‍රේණි

ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


| | |
|---|---|
| පෙරවදන | 04 |
| හැඳින්වීම | 05 |
| ජාතික පොදු අරමුණු | 06 |
| මූලික නිපුණතා | 08 |
| විෂය අරමුණු | 10 |
| ජාතික පොදු අරමුණු සහ විෂය අධ්‍යයනයේ අරමුණු අතර සම්බන්ධතාව | 11 |
| විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | 12 |
| විෂය නිර්දේශය 12 ශ්‍රේණිය | 13 |
| විෂය නිර්දේශය 13 ශ්‍රේණිය | 22 |
| නිර්දිෂ්ට ග්‍රන්ථ හා ආශ්‍රේය ග්‍රන්ථ | 27 |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 28 |
| තක්සේරුව හා ඇගයීම | 29 |
| ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය | 30 |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවෙහි අ.පො.ස (උසස් පෙළ) හින්දී විෂය සඳහා මෙම විෂය නිර්දේශය සම්පාදිත ය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ මෙම හින්දී විෂය නිර්දේශය පාසල් පද්ධතියෙහි ක්‍රියාත්මක වීමට නියමිත ව ඇත්තේ 2017 වර්ෂයේ සිට ය. 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම නව හින්දී විෂය නිර්දේශය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ඇතුළත් ගුරු මාර්ගෝපදේශ දෙකක් 12 සහ 13 ශ්‍රේණි සඳහා ඉදිරියේ දී හඳුන්වා දෙනු ඇත. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය, පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය, තක්සේරු හා ඇගයම් ආදිය පිළිබඳ ව ගුරු භවතුන්ට එයින් දැනුම්වත් විය හැකි ය.

හින්දී භාෂාව ශ්‍රී ලාංකිකයනට ඉතා සමීප භාෂාවකි. අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාව වන හෙයින් හින්දී භාෂාව හැදෑරීම දෙරට අතර සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීමට හේතු වන අතර රැකියා අවස්ථා හා උසස් අධ්‍යාපන අවස්ථා හිමි කර ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත. ලෝකයේ විශිෂ්ට සංස්කෘතීන් අතර සුවිශේෂ නාමයක් දරාගෙන ඇති භාරතීය සංස්කෘතියෙහි මූලධර්ම උකහාගෙන මානව හිතවාදී සමාජයක් ගොඩ නැඟීම සඳහා මංපෙත් විවර කර ගැනීමට හැකි වනු ඇත. එසේ ම හින්දී සාහිත්‍යය රසාස්වාදනයට අවස්ථාව සැලසෙන අතර එමගින් ලබා ගන්නා ආදර්ශ ඇසුරින් ජීවිතාවබෝධය ලබා ගැනීමට හැකි වනු ඇත.

හින්දී විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය

## විෂය හැඳින්වීම

හින්දී භාෂාව අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාව වන අතර, උතුරු ඉන්දියාවේ විශාල භූමි ප්‍රදේශයක වෙසෙන ඉන්දියානු ජනගහනයෙන් අඩකට ආසන්න ජනතාවගේ මාතෘ භාෂාව ද වේ. මීට අමතර ව සූරිනාම්, ෆීජී, ගයානා මුරුසි වැනි රටවල බහුල වශයෙන් ද, ලෝකයේ වෙනත් රටවල් රාශියක සාමාන්‍ය වශයෙන් ද හින්දී භාෂාව භාවිත වනු දක්නට ලැබෙයි. එමෙන් ම, ලෝකයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලය රාශියක සහ වෙනත් ආයතන රාශියක ද විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව උගන්වනු ලැබෙයි.

භාෂාත්මක වශයෙන් සිංහල භාෂාවට ඇති ඥාතිත්වයත්, ආගමික, සංස්කෘතික, සාහිත්‍යික, දේශපාලනික, ආර්ථික හා සමාජීය සම්බන්ධතාත් හේතු කොට ගෙන විදේශීය භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙනීම ශ්‍රී ලාංකිකයනට අතිශයින් වැදගත් වෙයි. විශේෂයෙන් ම සංගීතය, නර්තනය, චිත්‍ර ආදී පෙරදිග කලා මෙන් ම ආයුර්වේදය, පුරාවිද්‍යාව, ඉතිහාසය, අන්තර්ජාතික අධ්‍යයන වැනි විෂය ක්ෂේත්‍ර හැදෑරීමේ දී ද හින්දී භාෂාව අත්‍යවශ්‍ය ය.

මීට අමතර ව සංචාරක, ව්‍යාපාරිකවල, ජනමාධ්‍ය, මැද පෙරදිග සේවා, භාෂා පරිවර්තනය වැනි ක්ෂේත්‍ර කටයුතු කිරීමේ දී හින්දී භාෂා ඥානය ප්‍රයෝජනවත් වේ.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

## විෂය අධ්‍යයනයේ අරමුණු

01. විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව කථා කිරීම, ලිවීම, කියවීම හා ශ්‍රවණ හැකියාව ලබා ගැනීම හා ඒ මගින් අන්තර්ජාතික ප්‍රජාව අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගැනීම.

02. සන්නිවේදන කුසලතා සංවර්ධනය කර ගැනීම හා එමගින් විවිධ ක්ෂේත්‍රවලට අදාළ අන්තර්ජාතික සම්බන්ධතා ඇති කර ගැනීම.

03. හින්දී වාංමාලාව හා හින්දී බසෙහි ව්‍යාකරණ රටා ඉගෙනීම.

04. හින්දී භාෂාව ස්ව භාෂාවට පරිවර්තනය කිරීම සහ ස්ව භාෂාව හින්දී භාෂාවට පරිවර්තනය කිරීමෙන් පරිවර්තන හැකියාව වර්ධනය කර ගැනීම.

05. ඉන්දියානු ජන ජීවිතය සහ සමාජ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම, එමගින් සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගැනීම හා විචාරශීලී චින්තනය සංවර්ධනය කර ගැනීම.

06. විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂා අධ්‍යයන ක්‍රමවේද සංවර්ධනය.

07. සාහිත්‍ය රසාස්වාදයට යොමු වීම.

## ජාතික පොදු අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව (හින්දී)

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | |
| 1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම | ✓ | ✓ | ✓ | | | | ✓ | |
| 2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 3. මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳිමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | |
| 4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | |
| 5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |
| 6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | ✓ | |
| 7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම | | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | |
| 8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම (උපුටාගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව) | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | |

## හින්දි විෂය නිර්දේශය - 12, 13 ශ්‍රේණිය
## පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලසුම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 2.1, 2.2, 2.3<br>3.1, 3.2, 3.3, 4.1, 4.2<br>5.1, 5.2<br>6.1, 6.2, 6.3, 7.1 | 100 |
| | II | 4.3, 4.4, 4.5, 5.1, 5.2, 5.3<br>5.4, 5.5, 5.6,<br>6.3, 6.4<br>7.2, 8.1 | 100 |
| | III | 4.6, 6.2, 6.5, 6.6<br>8.1, 8.2, 8.3, 8.4,<br>9.1, 9.2<br>10.1, 10.2 | 100 |
| 13 | I | 1.1, 2.1, 2.2<br>3.1, 3.2<br>4.1 | 100 |
| | II | 3.2<br>4.2<br>5.1, 5.2 6.1, 6.2, 7.1, 8.1 | 100 |
| | III | 5 1, 7.1<br>7.2, 8 2, 9.1, 9.2<br>10.1, 10.2 | 100 |

## හින්දී විෂය නිර්දේශය -2017

12 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි. | 1.1 භාරතයේ ප්‍රාන්ත නම් කරයි.<br>1.2 හින්දී භාෂක කලාපය නම් කරයි. | • භාරතයේ ප්‍රාන්ත<br>• හින්දී භාෂක කලාපයට අයත් ප්‍රාන්ත | • භාරතයේ භූගෝලීය පිහිටීම විස්තර කරයි.<br>• භාරතයේ ප්‍රාන්ත නම් කරයි.<br>• හින්දී භාෂක කලාපය, සිතියමක නම් කරයි. | 02<br>03 |
| 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි. | 2.1 සම්මත වර්ණමාලාව නිවැරදි ව උච්චාරණය කරයි. | • සිංහල හා හින්දී වර්ණමාලාවෙහි ඇති උච්චාරණ වෙනස්කම් හඳුනා ගැනීම.<br>² अ, ऋ, ऐ, औ යන ස්වර උච්චාරණය.<br>• ण, ज्ञ යන ව්‍යංජන උච්චාරණය.<br>• හින්දියෙහි අනුනාසික ස්වර උච්චාරණය.<br>• ड़, ढ़ යන උත්ක්ෂිප්ත් ව්‍යංජන උච්චාරණය.<br>• क़, ख़, ग़, ज़, फ़ යන ඝෘණීකෘත ව්‍යංජන උච්චාරණය.<br>• හින්දියෙහි මහාප්‍රාණ ව්‍යංජන උච්චාරණය. | • ස්වර හා ව්‍යංජන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• अ, ऋ, ऐ, औ යන ස්වරවල විශේෂතා හඳුනා ගෙන උච්චාරණය කරයි.<br>• ण, य, व, ष, ह, ज्ञ ව්‍යංජනවල විශේෂතා හඳුනා ගෙන උච්චාරණය කරයි.<br>• අනුස්වාරය, අර්ධ අනුස්වාරය හා මහාප්‍රාණ අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.<br>• क़, ख़, ग़, ज़, फ़ ව්‍යංජනවල විශේෂතා හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• ड़, ढ़ යන උත්ක්ෂිප්ත් ව්‍යංජනවල විශේෂතා හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 හින්දී වචන නිවැරදි ව උච්චාරණය කරයි. | • ह ට පෙර अ ස්වරයේ උච්චාරණය<br>• ह ට පෙර ए ස්වරයේ උච්චාරණය<br>• य ට පෙර ऐ ස්වරයේ උච්චාරණය<br>• व ට පෙර औ ස්වරයේ උච්චාරණය<br>• පදාන්ත अ ස්වරය ලොප් වීම<br>• අල්පප්‍රාණ-මහාප්‍රාණ භේදය දක්වෙන වචන උච්චාරණය<br>• අනුනාසික ස්වර ඇතුළත් වචන උච්චාරණය<br>• මූර්ධන්‍ය ण දැක්වෙන වචන උච්චාරණය | • පදාන්ත ව්‍යංජනය හල් ව උච්චාරණය කරයි.<br>• ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කරයි.<br>• ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව 'එ' ලෙස උච්චාරණය කරයි.<br>• य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කරයි.<br>• व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කරයි. | 15 |
| | 2.3 හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි. | • අල්පප්‍රාණ-මහාප්‍රාණ, මූර්ධන්‍ය ව්‍යංජන සහිත වචන ඇතුළත් වාක්‍ය නිවැරදි ව උච්චාරණය<br>• ආඝාත, අනුතාන සහිත ව වාක්‍ය උච්චාරණය<br>• උච්චාරණ විශේෂතා ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය උච්චාරණය | • අල්පප්‍රාණ, මහාප්‍රාණ, මූර්ධන්‍ය, ඝෘණීකෘත උත්ක්ෂිප්ත් ව්‍යංජන සහ अ, ए, ऐ ,औ අර්ධ අනුස්වාර ස්වර සහිත වචනවල විශේෂ උච්චාරණ සහිත ව වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.<br>• භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා ආඝාතය නිවැරදි ව භාවිත කරයි.<br>• භාෂණයේ දී අර්ථ සන්නිවේදනය සඳහා අනුතානය සහිත ව වාක්‍ය උච්චාරණය කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සම්මත හින්දී භාෂාව නිවැරදි ව ලියයි. | 3.1 සම්මත වර්ණමාලාව නිවැරදි ව ලියයි. | • ස්වර, ව්‍යංජන, සංයුක්ත ව්‍යංජන. | • හින්දී වර්ණමාලාවේ ස්වර ලියා දක්වයි.<br>• හින්දී වර්ණමාලාවේ ව්‍යංජන ලියා දක්වයි.<br>• සංයුක්ත අකුරු ලියයි. | 06 |
| | 3.2 හින්දී වර්ණමාලාව භාවිත කර නිවැරදි ව වචන ලියයි. | • පිලි පිළිබඳ සම්මත භාවිතය.<br>• හල් කිරීම, අනුස්වාරය, අර්ධඅනුස්වාරය, විසර්ගය, උත්ක්ෂිප්ත් ව්‍යංජන, රකාරාංශය, රේඵය ආදියෙහි සම්මත නීති භාවිත කර වචන ලිවීම. | • ස්වර පිල්ලම් භාවිත කරමින් වචන ලියයි.<br>• හල් කිරීම භාවිත කරමින් වචන ලියයි.<br>• අනුස්වාරය භාවිත කරමින් වචන ලියයි.<br>• අර්ධ අනුස්වාරය භාවිත කරමින් වචන ලියයි.<br>• විසර්ගය භාවිත කරමින් වචන ලියයි.<br>• රේඵය භාවිත කරමින් වචන ලියයි.<br>• උත්ක්ෂිප්ත් ධ්වනි භාවිත කරමින් වචන ලියයි.<br>• රකාරාංශය භාවිත කරමින් වචන ලියයි. | 10 |
| | 3.3 හින්දියෙන් වාක්‍ය ලියයි. | • සම්මත වියරණ භාවිත කරමින් වාක්‍ය ලිවීම. | • නිවැරදි අක්ෂර වින්‍යාසය සැලකිල්ලට ගෙන වාක්‍ය ලියයි.<br>• විරාම ලක්ෂණ නිවැරදි ව භාවිත කරයි.<br>• සම්මත වියරණ භාවිත කරමින් වාක්‍ය ලියයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | 4.1 සවන් දී හින්දී ශබ්ද හඳුනා ගනියි. | • හින්දී ශබ්ද උච්චාරණයට සවන් දී අකුරු හඳුනා ගැනීම.<br>• සිංහල භාෂාවේ නොමැති හින්දියට ආවේණික ශබ්ද හඳුනා ගැනීම. | • අල්පප්‍රාණ සහ මහාප්‍රාණ අකුරුවල උච්චාරණයට සවන් දී ඒවායෙහි වෙනස හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• अ, ऐ, औ, ऋ, ज़, ड़, ढ़ යන අකුරුවල උච්චාරණයට සවන් දී සිංහල භාෂාවෙන් වෙනස් වන අයුරු ප්‍රකාශ කරයි. | 05 |
| | 4.2 සවන් දී වචන හඳුනා ගනියි. | • ලේඛනයට වෙනස් වූ උච්චාරණ සහිත වචන.<br>• රේඵය, අනුස්වාරය, අර්ධ අනුස්වාරය, විසර්ගය, රකාරාංශය යෙදෙන වචන. | • වචනාන්ත ව්‍යංජනය හල් ව උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• ह ට පෙර ඇති अ ස්වරය හ්‍රස්ව 'ඇ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• ह ට පෙර ඇති ए ස්වරය හ්‍රස්ව ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• य ට පෙර ඇති ऐ ස්වරය 'අයි' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• व ට පෙර ඇති औ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කෙරෙන බව සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.<br>• අනුස්වාරය හා අර්ධානුස්වාරය අතර ඇති වෙනස උච්චාරණයට සවන් දීමෙන් අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.3 වාක්‍යවලට සවන් දී අර්ථාවබෝධයෙන් ප්‍රතිචාර දක්වයි. | • උච්චාරණයට අනුව ප්‍රශ්නයක් ද, ප්‍රකාශයක් ද, විස්මය දනවන්නක් ද යන්න හඳුනා ගැනීම. | i. වාක්‍යවලට සවන් දී අර්ථය ප්‍රකාශ කරයි.<br>ii. වාක්‍යවලට සවන් දී විධානය වටහා ගෙන ප්‍රතිචාර දක්වයි. | 08 |
| 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි | 5.1 අවස්ථානුකූල ව ආචාර කරයි. | • විවිධ පුද්ගලයන්ට, හමුවීමක දී සහ වෙන් වීමක දී ආචාර කිරීම සඳහා භාවිත කෙරෙන යෙදුම් හඳුනා ගැනීම. | i. පූජකවරයකුට ආචාර කරයි.<br>ii.ගුරුවරයාට ආචාර කරයි.<br>iii. වැඩිහිටියකුට ආචාර කරයි.<br>iv. තමා හා සමාන පුද්ගලයකුට ආචාර කරයි. | 04 |
| | 5.2 තමා සහ වෙනත් පුද්ගලයන් හඳුන්වා දෙයි. | • තමන් හඳුන්වා දීම<br>• වෙනත් පුද්ගලයකු හඳුන්වා දීම | i. තමන් හඳුන්වා දෙයි.<br>ii. වෙනත් කෙනෙකු හඳුන්වා දෙයි. | 04 |
| | 5.3 පෞද්ගලික තොරතුරු විමසයි. | • ප්‍රශ්නවාචක පද භාවිත කරමින් නම,ගම, වයස, පවුලේ තොරතුරු, සුවදුක් යනාදිය විමසීම. | i. ප්‍රශ්නවාචක පද භාවිත කරමින් භාෂණයේ යෙදෙයි.<br>ii. ප්‍රශ්න අසයි.<br>iii. පිළිතුරු දෙයි. | 05 |
| | 5.4 අවස්ථානුකූල ව සුබ පතයි. | • උපන් දිනයක දී, විවාහයේදී, ජයග්‍රහණයක දී, විවිධ උත්සව අවස්ථාවල දී සුබ පැතීම. | i. අවස්ථාව හඳුනා ගෙන සුබ පතයි.<br>ii. ප්‍රතිචාර දක්වයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.5 හැඟීම් ප්‍රකාශ කරයි. | • සතුට, අසතුට, දුක, පුදුමය, එකඟතාව විරුද්ධත්වය, කැමැත්ත, අකමැත්ත, කුසගින්න, පිපාසය සහ පාරිසරික වෙනස්කම් (රස්නය, සීතල) ප්‍රකාශ කරයි. | • හැඟීම් ප්‍රකාශනයට අවශ්‍ය වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා භාවිත වන වාක්‍ය රටා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• හැඟීම් ප්‍රකාශනයට අවශ්‍ය වචන භාවිත කරයි.<br>• අවස්ථානුකූල ව හැඟීම් ප්‍රකාශ කරමින් භාෂණයේ යෙදෙයි. | 06 |
| | 5.6 ආචාරශීලී ව කථා කරයි. | • ස්තුති කිරීම, සමාව ගැනීම, අවසර ගැනීම 'ඔව්' සහ 'බැහැ' යනුවෙන් පැවසීම. | • ස්තුති කරයි.<br>• සමාව ගනියි.<br>• අවසර ගනියි.<br>• අවස්ථානුකූල ව 'ඔව්' සහ 'බැහැ' යනුවෙන් ප්‍රකාශ කරයි. | 06 |
| 6.0 මූලික ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 6.1 නාම පද, සර්වනාම පද, විශේෂණ පද, විභක්ති ප්‍රත්‍යය ව්‍යාකරණානුකූල ව භාවිත කරමින් වාක්‍ය ලියයි. | **සම්මත හින්දී ව්‍යාකරණය සහ භාෂා ප්‍රයෝග**<br>• නාමපදවල ව්‍යාකරණානුකූල භාවිතය: වචන භේදය, ලිංග භේදය<br>• සර්වනාම පදවල ව්‍යාකරණානුකූල භාවිතය: වර්තමාන සරල සහායක ක්‍රියා (සරල් වර්ත්මාන්)<br>• විශේෂණ පදවල ව්‍යාකරණානුකූල භාවිතය<br>• විභක්ති ප්‍රත්‍යය භාවිතය: නාමපද සහ විභක්ති ප්‍රත්‍යය සර්වනාම සහ විභක්ති ප්‍රත්‍යය | • නාමපද භාවිත කරමින් වාක්‍ය ලියයි.<br>• සර්වනාම පද භාවිත කරමින් වාක්‍ය ලියයි.<br>• විශේෂණ පද භාවිත කරමින් වාක්‍ය ලියයි.<br>• විභක්ති ප්‍රත්‍යය භාවිත කරමින් වාක්‍ය ලියයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 විධි ක්‍රියා, සහායක ක්‍රියා, ප්‍රේරණාර්ථක් ක්‍රියා භාවිත කරමින් වාක්‍ය ලියයි. | • **ක්‍රියා ප්‍රභේද :**<br>විධි ක්‍රියා<br>සහායක ක්‍රියා चाहिए, सकना, लगना, पड़ना, चुकना<br>ප්‍රේරණාර්ථක් ක්‍රියා (ප්‍රයෝජ්‍ය ක්‍රියා) | • විධික්‍රියා රූප හඳුනා ගෙන වාක්‍යවල යොදයි.<br>• සහායක ක්‍රියා හඳුනා ගෙන භාවිත කරයි.<br>• ප්‍රේරණාර්ථක් (ප්‍රයෝජ්‍ය ක්‍රියා) හඳුනා ගෙන වාක්‍යවල යොදයි. | 15 |
| | 6.3 වර්තමාන කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි. | • වර්තමාන කාලය -සරල වර්තමානය, සාමාන්‍ය වර්තමානය, තාත්කාලික් වර්තමානය, ආභ්‍යාසික් වර්තමානය, සංදේහාත්මක් වර්තමානය | • වර්තමාන ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන යොදයි.<br>• වර්තමාන කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කර ගෙන භාවිත කරයි. | 15 |
| | 6.4 අනාගත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි. | • අනාගත කාලය- සරල් භවිෂ්‍ය, සාමාන්‍ය භවිෂ්‍ය, සම්භාව්‍ය භවිෂ්‍ය | • සරල් භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• සාමාන්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• සම්භාව්‍ය භවිෂ්‍ය කාල ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• අනාගත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කර ගෙන වාක්‍ය නිවැරදි ව ලියයි. | 07 |
| | 6.5 අතීත කාල ප්‍රභේද භාවිත කරමින් වාක්‍ය ලියයි. | • අතීත කාලය - සරල් භූත්, තාත්කාලික් භූත්, ආභ්‍යාසික් භූත්, සාමාන්‍ය භූත්, ආසන්න භූත්, පූර්ණ භූත්, සංදේහාත්මක් භූත්<br>• සමාපක් භූත් | • අතීත කාල ක්‍රියාපද නිර්මාණ කරයි.<br>• ක්‍රියාවේ අකර්මක, සකර්මක භේදය හඳුනා ගෙන යොදයි.<br>• අතීත කාල ක්‍රියා ප්‍රභේද හඳුනා ගෙන භාවිත කරයි.<br>• අතීත කාල ක්‍රියා ප්‍රභේද අතර ඇති වෙනස්කම් අවබෝධ කරගෙන අදහස් ප්‍රකාශ කරයි. | 13 |
| | 6.6 හින්දී සංඛ්‍යාංකනය පිළිබඳ අවබෝධය ලබයි. | • සංඛ්‍යාංකනය (1 සිට 100 තෙක් හින්දී සංඛ්‍යා නාම සහ අපූර්ණ සංඛ්‍යා) ගණන සංඛ්‍යා, ක්‍රමවාචී සංඛ්‍යා, ගුණවාචී සංඛ්‍යා, යෝගවාචී සංඛ්‍යා | • 1-100 තෙක් පූර්ණ සංඛ්‍යා හින්දියෙන් දක්වයි.<br>• කාල, භාග, තුන්කාල ආදි අපූර්ණ සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.<br>• ක්‍රමවාචී, ගුණවාචී, යෝගවාචී සංඛ්‍යා නිවැරදි ව භාවිත කරයි.<br>• මිනුම් ඒකක හින්දියෙන් දක්වයි<br>• වේලාව සහ වර්ෂ ප්‍රකාශ කරයි.<br>• දහස, ලක්ෂය, කෝටිය යන සංඛ්‍යා ප්‍රකාශ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 කියවා ප්‍රතිචාර දක්වයි | 7.1 ශබ්ද නඟා කියවයි. | • සරල වාක්‍ය සරල ගද්‍ය හා පද්‍ය පාඨ යනාදිය හඩ පාලනයෙන් යුතු ව කියවීම | • වචන පැහැදිලි ව උච්චාරණය කරමින් කියවයි.<br>• අවබෝධයෙන් යුතු ව හඬ පාලනය කරමින් කියවයි. | 08 |
| | 7.2 නිශ්ශබ්ද ව කියවා අර්ථය අවබෝධ කර ගනියි. | • සරල ඡේදයක්, කථාන්තරයක්, ආරාධනා පත්‍රයක්, සුබ පැතුම්පතක්, ලිපියක්, පණිවිඩයක් යනාදිය. | • දෙන ලද පාඨය කියවා නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.<br>• දෙන ලද පාඨය නිශ්ශබ්ද ව කියවා පිළිතුරු ලකුණු කරයි.<br>• පිළිතුරු තෝරයි.<br>• හරි වැරදි ලකුණු කරයි. | 10 |
| 8.0 පරිවර්තනය කරයි. | 8.1 සරල හින්දී වාක්‍ය සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි. | • සරල හින්දී වාක්‍ය<br>• සරල හින්දී ගද්‍ය හා පද්‍ය පාඨ | • දී ඇති සරල වාක්‍ය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි.<br>• සරල ගද්‍ය සහ පද්‍ය පාඨවල අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 08 |
| | 8.2 සරල හින්දී ගද්‍ය හා පද්‍ය පාඨ සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි. | | | 08 |
| | 8.3 සිංහල/දෙමළ/ ඉංග්‍රීසි සරල වාක්‍ය හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල වාක්‍ය සහ සරල ගද්‍ය පාඨ | • දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල වාක්‍ය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි.<br>• සරල ගද්‍ය පාඨ අවබෝධ කර ගෙන හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | 08 |
| | 8.4 සිංහල/දෙමළ/ ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | | | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 9.1 ගද්‍ය කියවා රස විඳියි. චරිතායනය කරයි. | • ගද්‍ය පාඨ කියවා රස විඳීම.<br>• අවස්ථා සම්බන්ධය දැක්වීම. | • ගද්‍යාංගය නිවැරදි ව කියවයි.<br>• දුරවබෝධ පදවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• අවබෝධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් අවස්ථා සම්බන්ධය දක්වයි.<br>• ගද්‍යාංගයට අදාළ පණිවිඩය ප්‍රකාශ කරයි. | 20 |
| | 9.2 පද්‍ය කියවා රස විඳියි. චරිතායනය කරයි. | • පද්‍ය පාඨ කියවා රස විඳීම සහ අර්ථය සරල හින්දි බසින් ලිවීම. | • හැඟීම් දනවන පරිදි රිද්මයකට අනුව පද්‍ය ගායනා කරයි.<br>• දුරවබෝධ පදවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• සම්මත වාක්‍ය රටාවෙන් බැහැර ව පද්‍යයේ දී පද ගැළපෙන බව කියයි.<br>• රස වින්දනය සඳහා අවබෝධ ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>• පද්‍යයේ අර්ථය සරල හින්දියෙන් ප්‍රකාශ කරයි. | 20 |
| 10.0 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි. | 10.1 නූතන හින්දී සාහිත්‍යයේ යුග නම් කරයි.<br>10.2 නූතන හින්දී සාහිත්‍යයේ යුග පසුබිම විස්තර කරයි. | • නූතන යුගය : භාරතේන්දු යුගය, ද්විවේදී යුගය, ඡායාවාදී යුගය, ඡායාවාදෝත්තර් යුගය. | • කාලවකවනුව සහිත ව සාහිත්යික යුග නම් කරයි.<br>• යුග පසුබිම විස්තර කරයි.<br>• යුගයේ සාහිත්යික විශේෂතා නම් කරයි. | 10<br>12 |

13 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි. | 1.1 භාරතයේ ව්‍යවහාර වන භාෂා නම් කරයි.<br>1.2 හින්දී භාෂක කලාපයේ උපභාෂා නම් කරයි. | • භාරතයේ ප්‍රාන්ත හා සාංගමික රාජ්‍ය, ඒවායෙහි භාවිත ප්‍රධාන භාෂා<br>• හින්දී භාෂක කලාපයේ ප්‍රධාන උපභාෂා 5 | • හින්දියේ ප්‍රධාන උපභාෂා නම් කරයි.<br>• එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර කෙරෙන ප්‍රධාන භාෂාව නම් කරයි.<br>• හින්දී භාෂාව, සංස්කෘත භාෂාවෙන් විකාසය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් බව කියයි. | 03<br>04 |
| 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි. | 2.1 සරල ගද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.<br>2.2 සරල පද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි. | • සරල ගද්‍ය පාඨ<br>• සරල පද්‍ය පාඨ | • ආඝාතය සහ අනුතාන සහිත ව ගද්‍ය පාඨ උච්චාරණය කරයි.<br>• පද්‍ය පාඨ රිද්මයනුකූල ව උච්චාරණය කරයි. | 10<br>10 |
| 3.0 සම්මත හින්දී භාෂාව නිවැරදි ව ලියයි. | 3.1 සරල රචනා සහ ලිපි ලියයි.<br>3.2 කතාන්තර නිර්මාණය කරයි. | • රචනාඃ දෙන ලද මාතෘකාවක් යටතේ රචනා ලිවීම.<br>• ලිපිඃ දෙන ලද උපදෙස්වලට අනුව පෞද්ගලික ලිපි ලිවීම. (මිතුරු-මිතුරු, දෙමවුපිය - දූදරු, ගුරු-ශිෂ්‍ය)<br>• දෙන ලද සැකිල්ලකට අනුව කථාන්තර ලිවීම. | • මාතෘකාවට අදාළ ව ලියයි.<br>• ව්‍යාකරණ රීතීවලට අනුගත ව ලියයි.<br>• අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ප්‍රමාණාත්මක ව කරුණු ඉදිරිපත් කරයි.<br>• නිවැරදි ආකෘතියට අනුව ලිපි හා රචනා ලියයි.<br>• සැකිල්ල අවබෝධ කර ගෙන කතාවක් නිර්මාණය කරයි. | 20<br>16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | 4.1 සරල ඡේදයකට සවන් දී අර්ථාවබෝධ කර ගනියි. | • සරල ඡේද ආශ්‍රයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීම<br>• කථාන්තර | • සරල ඡේද ආශ්‍රයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයයි.<br>• නිවැරදි පිළිතුර තෝරයි.<br>• හරි වැරදි ලකුණු කරයි.<br>• සරල ඡේදයකට හෝ කථාන්තරයකට හෝ සවන් දී වාචික ව හා ක්‍රියාවෙන් ප්‍රතිචාර දක්වයි. | 15 |
| | 4.2 සරල පද්‍යයකට සවන් දී අර්ථාවබෝධ කර ගනියි. | • සරල පද්‍ය | • සරල පද්‍ය ආශ්‍රයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයයි.<br>• සරල පද්‍යයකට සවන් දී වාචික ව හා ක්‍රියාවෙන් ප්‍රතිචාර දක්වයි. | 15 |
| 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි. | 5.1 සංවාදයේ යෙදෙයි. | • වෙළෙඳපොළේ දී: පලතුරු, එළවුළු, පොත්, රෙදි යනාදි වෙළෙඳසැල්වල දී භාවිත වන සරල දෙබස්<br>• විවිධ ස්ථානවල දී: තැපැල්හල, දුම්රිය ස්ථානය, බැංකුව, හෝටලය<br>• මිතුරකු, ගුරුතුමා සහ වෛද්‍යවරයා සමඟ<br>• යම්කිසි ස්ථානයකට පිවිසෙන මාර්ගය පිළිබඳ විමසීම සහ පිළිතුරු දීම.<br>• පෞද්ගලික සහ රාජකාරි කටයුතු සඳහා දූරකථනයෙන් සංවාදයේ යෙදීම. | • ස්ථානවලට අදාළ වචන භාවිත කරයි.<br>• අදාළ ස්ථානයේ දී සුදුසු භාෂා යෙදුම් භාවිත කරයි.<br>• සංවාදයේ යෙදෙයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 අවස්ථානුකූල ව කථා පවත්වයි. | ● පිළිගැනීමේ කථාව.<br>● ස්තුති කථාව<br>● දෙන ලද සරල මාතෘකාවකට අනුව කථා කිරීම. | ● අවස්ථාව නිවැරදි ව අවබෝධ කරගෙන අවසර ගනියි. ආමන්ත්‍රණය කරයි.<br>● මාතෘකානුකූල ව කරුණු ගොනු කර ප්‍රකාශ කරයි.<br>● අදහස් සංවිධානාත්මක ව පෙළ ගස්වා ඉදිරිපත් කරයි.<br>● ව්‍යක්ත ලෙස කතා කරයි. | 15 |
| 6.0 සම්මත වියරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත | 6.1 අව්‍ය පිළිබඳ අවබෝධය ලබයි. | ● සම්බන්ධ සූචක, සමුච්චයබෝධක, විස්මයාදිබෝධක, ක්‍රියා විශේෂණ | ● සම්බන්ධ සූචක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.<br>● සමුච්චයබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.<br>● විස්මයාදිබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.<br>● ක්‍රියා විශේෂණ නිවැරදි ව භාවිත කරයි. | 20 |
| | 6.2 කෘදන්ත පිළිබඳ අවබෝධය ලබයි. | ● කෘදන්ත - විකාරී සහ අවිකාරී කෘදන්ත | ● කෘදන්ත පද විකාරී හා අවිකාරී වශයෙන් මූලික ප්‍රභේද දෙකක් ඇති බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>● කෘදන්ත ප්‍රභේද හඳුනා ගෙන භාවිත කරයි. | 15 |
| 7.0 කියවා ප්‍රතිචාර දක්වයි. | 7.1 චිත්‍ර සටහන් විස්තර කරයි. | ● සරල අදහස් ප්‍රකාශ කෙරෙන පින්තූර | ● පින්තූරයෙහි දැක්වෙන රූප හා ක්‍රියා විස්තර කරයි.<br>● ව්‍යාකරණ රීති අනුව වාක්‍ය ගොඩ නගයි.<br>● වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි. | 12 |
| | 7.2 සරල ඡේද හා පද්‍ය කොටස් කියවා විස්තර කරයි. | ● සරල ඡේද හා පද්‍ය කොටස් | ● ගද්‍ය සහ පද්‍ය පාඨ නිශ්ශබ්ද ව කියවයි.<br>● අවබෝධයෙන් පිළිතුරු සපයයි.<br>● අර්ථය සරල හින්දියෙන් ප්‍රකාශ කරයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 පරිවර්තනය කරයි. | 8.1 හින්දී ගද්‍ය පාඨ සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි. | • හින්දී ගද්‍ය පාඨ/සංවාද සහ ඒ හා සමාන මට්ටමේ වෙනත් ගද්‍ය පාඨ පරිවර්තනය කිරීම. | • දී ඇති හින්දී ගද්‍ය පාඨය අවධානයෙන් කියවයි.<br>• ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 15 |
| | 8.2 සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගද්‍ය පාඨ හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ/සංවාද හින්දී භාෂාවට පරිවර්තනය කිරීම. | • දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගද්‍ය පාඨය අවධානයෙන් කියවයි.<br>• ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 15 |
| 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 9.1 හින්දී සාහිත්‍යාංග රස විඳියි. | • ගද්‍ය පාඨ සහ පද්‍ය පාඨ | • හින්දී ගද්‍ය, පද්‍ය කියවයි.<br>• දුරවබෝධ පද අවබෝධ කර ගෙන ගද්‍ය/ පද්‍යවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• අවස්ථා සම්බන්ධය දක්වයි. | 20 |
| | 9.2 භාරතයේ ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත හඳුනා ගනියි. | • පුද්ගල චරිත | • බුදුන් වහන්සේ, මහත්මා ගාන්ධි වැනි ශ්‍රේෂ්ඨ චරිත විස්තර කරයි.<br>² එම චරිත ආශ්‍රයයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයයි. | 15 |
| | 9.3 හින්දී සාහිත්‍යාංග ඇසුරින් උත්තර භාරතීය සංස්කෘතිය හඳුනා ගනියි. | • ආහාර-පාන, ඇඳුම්-පැලඳුම්, කෙළි-සෙල්ලම් සහ උත්සව | • උත්තර භාරතීය ආහාර-පාන නම් කරයි.<br>• උත්තර භාරතීය ඇඳුම්-පැලඳුම් නම් කරයි.<br>• උත්තර භාරතීය උත්සව නම් කරයි.<br>• උත්තර භාරතීය ක්‍රීඩා (කෙළි-සෙල්ලම්) නම් කරයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි. | 10.1 නූතන හින්දී සාහිත්‍යයේ එන සාහිත්‍යකරුවන් හඳුනා ගනියි.<br><br>10.2 නූතන හින්දී සාහිත්‍යයේ එන සාහිත්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනා ගනියි. | • භාරතේන්දු හරිශ්චන්ද්‍ර, මහාවීර් ප්‍රසාද් ද්විවේදී, මැථිලීශරණ් ගුප්ත්, ජයශංකර් ප්‍රසාද්, සුමිත්‍රානන්දන් පන්ත්, සූර්යකාන්ත් ත්‍රිපාඨී 'නිරාලා', මහාදේවී වර්මා, ප්‍රේම්චන්ද්, යශ්පාල්, අම්රිත්ලාල් නාගර්, විෂ්ණු ප්‍රභාකර්, විශ්වම්බර්නාථ් ශර්මා ආදී සාහිත්‍යකරුවන් සහ ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ අවබෝධය ලබා ගැනීම. | • සාහිත්‍යධරයන් නම් කරයි.<br>• ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.<br>• සාහිත්‍යධරයන්ගේ සේවාව විස්තර කරයි. | 10<br><br>15 |

**නිර්දිෂ්ට ග්‍රන්ථ :**


1. **මන්ථන් හින්දී පාඨාවලී** (2010) සරස්වතී හවුස් ප්‍රයිවෙට් ලිමිටඩ්, නවදිල්ලී.

2. **භාෂා භාරතී භාග්** 1 (2007) හාර් කී ජීත් - සුදර්ශන් සහ දුඛ් කා අධිකාර්- යශ්පාල්, යුනයිටඩ් පබ්ලිෂින්ග් හවුස්, නවදිල්ලී.

3. **නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය** (2009) (සංශෝධිත සංස්කරණය), උපුල් රංජිත් හේවාවිතානගමගේ.


**පරිශීලන ග්‍රන්ථ :**


1. **බාල් හින්දී ව්‍යාකරණ් තථා රචනා**, ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව දිල්ලී.

2. **කථා සරිතා** (භාග් 3, 4), දිවාකර් පාණ්ඩේය, ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව දිල්ලී.

3. **හින්දී ව්යරණ හුරුව** (2005, 2008 පළමු සංස්කරණය) ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

4. **හින්දී ලේඛන හුරුව** (2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, කර්තෘ ප්‍රකාශනයකි.

5. **හින්දී කථන හුරුව** (2010) ඉන්ද්‍රා දසනායක, ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

හින්දී භාෂාව හැදෑරීමෙන් පසු එම දැනුම, කුසලතා හා නව ආකල්ප භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්ය ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එනම්,

1. **'විශ්ව හින්දී දිනය/හින්දී භාෂා දිනය'** සැමරීම.

2. ස්ව නිර්මාණ ද ඇතුළත් **'හින්දී සඟරාවක්'** නිර්මාණය කිරීම.

3. පාසලේ පැවැත්වෙන රැස්වීම්වල දී හින්දී බසින් ප්‍රවෘත්ති, කථා සහ ගීත ආදිය ඉදිරිපත් කිරීම.

4. උත්තර භාරතීය සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.

5. පාසල තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ හින්දී බසින් රචනා, කථික, ගීත නිර්මාණ, නාට්‍ය ආදි තරග පැවැත්වීම.

6. හින්දී භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා තද්විෂයය හා සම්බන්ධ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

# තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත යි.

- 13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

- මෙම විෂය නිර්දේශය පදනම් කර ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ.

- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මඟින් සැපයෙනු ඇත.

## ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය

1. ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා

1.1 කණ්ඩායම් වශයෙන් වෙන් කොට උච්චාරණයට අදාළ ශබ්ද හඳුනා ගැනීමට සැලැස්වීම.

1.2 කියවන විට ලිවීම

1.3 ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය ඇසුරෙන් උච්චාරණ විශේෂතා අධ්‍යයනය කිරීමට සැලැස්වීම.

1.4 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනි ව ම හෝ වචනයට අදාළ රූපයත්, රූපයට අදාළ වචනයත් හඳුනා ගැනීමට සැලැස්වීම.

2. ව්‍යාකරණය

2.1 සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස කරවීම.

2.2 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ ඉගෙනගත් ව්‍යාකරණ පාඩම් සිසුන් ලවා පැහැදිලි කිරීමට සැලැස්වීම.

3. සංවාද පුහුණුව

3.1 සිසුන්ගෙන් උත්තර බලාපොරොත්තුවෙන් ප්‍රශ්න ඇසීම.

3.2 උත්තරයට අදාළ ප්‍රශ්නය සිසුන් ලවා විමසවීම.

3.3 ක්ෂණික මාතෘකා යටතේ කෙටි වාක්‍ය නිර්මාණය කිරීම.

3.4 පින්තූර පෙන්වා විස්තර ඇසීම.

3..5 යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් හෝ සංවාද පුහුණු කිරීම.

4. පන්තිය තුළ ම හින්දී පොතපත කියවීම පුහුණු කිරීම සඳහා පුස්තකාලයයක් පවත්වාගෙන යෑම.

5. අන්තර්ජාලය පරිහරණයෙන් හින්දී භාෂා ඥානය වර්ධනය කර ගැනීම.

## අ.පො.ස. (උසස් පෙළ) හින්දී විෂය නිර්දේශය

### සම්පාදක මණ්ඩලය 2017

**මාර්ගෝපදේශය** : අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය** : ඊ.එම්. තනුජා ජයතිලක මිය
සහකාර කථිකාචාර්ය
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්පත් දායකත්වය**

01. මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ මයා
මහාචාර්ය, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

02. මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න
මහාචාර්ය, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

03. අනුෂා නිල්මිණි සල්වතුර මිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

04. නීතා සුභාෂිණී සෙනෙවිරත්න මිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

05. බ්‍රසිල් නාගොඩවිතාන මයා
කථිකාචාර්ය, විදේශ භාෂා අධ්‍යයන අංශය,
සබරගමුව විශ්වවිද්‍යාලය.

06. නිරෝෂා සල්වතුර මිය
කථිකාචාර්ය,
පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය.

07. ජයන්තා මනෝරී මිය
බාහිර කථිකාචාර්ය, භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

08. ආර්.ජේ.කේ. අනෝමා මිය
ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය

09. ඩබ්.එම්.මාධවී ඩී. ජයරත්න මිය
කු/මලියදේව බාලිකා විද්‍යාලය.